(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 12(6).]

# පාර්ලිමේන්තුවේ අංක 12 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2014 ඔක්තෝබර් මස 17 වැනි සිකුරාදා**

## 2014 නොවැම්බර් මස 03 වැනි සඳුදා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2740/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2005 වර්ෂයේ සිට අද දක්වා මහජන බැංකුව විසින් ලබාදී ඇති ණය මුදල්වලින් බොල් ණය ලෙස කපා හැර ඇති ණය ප්‍රමාණය වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත කාල සීමාව තුළදී මහජන බැංකුව විසින් බොල් ණය ලෙස කපා හැර ඇති ණය ප්‍රමාණය එම බැංකුව ලබා දී ඇති මුළු ණය ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3547/'13

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ වර්තමාන පාර්ලිමේන්තුවේ සිටින මන්ත්‍රීවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) මහජන කටයුතු පහසුවෙන් සිදු කිරීම සඳහා පහසුකම් සැලසීම පිණිස 2000 වර්ෂයේ සිට භාරයන් සංස්ථාපනය කරන ලද පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ නම් කවරේද;

(iii) ඉහත කී භාරයන්ගේ නම් සහ ඒවා සංස්ථාගත කරන ලද දිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත කී භාරයන් සඳහා බදු ගෙවනු ලැබේද;

(ii) නොඑසේ නම්, බදු අදාළ නොවන ක්ෂේත්‍ර කවරේද;

(iii) භාරයන් සංස්ථාගත කිරීම හේතු කොටගෙන ආදායම අහිමි වීම මත සිදුවන සමස්ත අලාභය කවරේද;

(iv) එක් එක් භාරය තුළින් ඉටු කර ගැනීමට නියමිත අරමුණු වර්තමාන තත්ත්වය තුළ ක්‍රියාත්මක වෙමින් තිබේද;

(v) ඉහත කී භාරයන් හා සම්බන්ධව කිසියම් වැරදි භාවිතයක් සිදු වෙමින් පවතීද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4264/’13

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1950.04.05 වැනි දින උපත ලබා ඇති ජාතික ශිෂ්‍යභට බලකා අධ්‍යක්ෂ මේජර් ජෙනරාල් ඩබ්ලිව්. පී. බී. ජයසුන්දර මහතා මේ වන විට අවුරුදු 64 ඉක්මවූවකු බවත්;

(ii) සේවා දිගු සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරය සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාව පළ කරන ලද විරෝධතා නොතකා 2012 හා 2013 වර්ෂවලදී ඒ මහතාට සේවා දිගු ලබාදී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) විශ්‍රාම යාමට නියමිත වයස සම්පූර්ණ කළ නිලධාරියෙකු තවදුරටත් සේවයේ තබාගෙන සිටීම නිසා රජයට අමතර වියදමක් දැරීමට සිදුවන බවත්;

(ii) විශ්‍රාම යාමට නියමිත නිලධාරීන්ට මෙලෙස සේවා දිගු ලබා දෙමින් කටයුතු කිරීම හේතුවෙන් උසස්වීම් අවස්ථා අහිමිවන පහල ශ්‍රේණිවල නිලධාරීන් දැඩි සේ කලකිරීමට පත්වන බවත්;

එතුමා පිලිගන්නෙහිද?

(ඇ) එසේ නම්, ඉහත අ(i) හි සඳහන් නිලධාරියාගේ සේවා දිගුව නවතාලීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4424/’13

ගරු රෝසි සේනානායක මහත්මිය,— ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමලය චීන වරාය ආශ්‍රිතව නව සිමෙන්ති කර්මාන්ත ශාලාවක් ආරම්භ කිරීමට පියවර ගෙන තිබේද;

(ii) මෙම යෝජිත කර්මාන්ත ශාලාව ඉදිකිරීමට අදාළව පරිසර වාර්තාවක් ලබාගෙන තිබේද;

(iii) එසේ නම්, එම වාර්තාවේ අන්තර්ගතය මෙම සභාවට ඉදිරිපත් කළ හැකිද;

(iv) එකී කර්මාන්ත ශාලාව ඉදිකිරීම නිසා, මත්ස්‍ය සම්පත විනාශවීමේ තර්ජනයක් ඇතිවන බවට පැමිණිලි හෝ විරෝධතා ලැබී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4468/’13

ගරු අනුර දිසානායක මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010, 2011 හා 2012 යන වර්ෂවලදී එක්සත් ජනපදයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය Cranford Johnson Robinson Wood නමැති සමාගම සමග ගනුදෙනු කර තිබේද;

(ii) එසේ නම්, එම ගනුදෙනු සිදුවී ඇති දින වකවානු කවරේද;

(iii) එම ගනුදෙනු තුළින් ඉටු කර ගෙන ඇති කාර්යය හෝ කාර්යයන් කවරේද;

(iv) එමගින් ලැබී ඇති ප්‍රයෝජන කවරේද;

(v) එම කටයුතු වෙනුවෙන් කරන ලද ගෙවීම්වල වටිනාකම කොපමණද;

(vi) ඒ සඳහා මුදල් වෙන් කරනු ලැබූ වැය ශීර්ෂය කවරේද;

(vii) එම සමාගම සමග ගිවිසුම්වලට එළැඹ ඇත්නම්, එම ගිවිසුම් සභාගත කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4677/'13

ගරු පී. හැරිසන් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ වාර්තා වූ ඩෙංගු රෝගීන් සංඛ්‍යාවේ වර්ධනය 2011, 2012 සහ 2013 වර්ෂවලදී වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත සඳහන් වර්ෂවලදී ඩෙංගු රෝගයෙන් මියගිය සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත වර්ෂයන්හිදී වැඩිම ඩෙංගු මරණ සංඛ්‍යාවක් වාර්තා වී ඇති දිස්ත්‍රික්ක අනුපිළිවෙළින් එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) (i) ඩෙංගු මර්දනය සඳහා ක්‍රියාත්මක කළ වැඩපිළිවෙළ කවරේද;

(ii) ඒ සඳහා පසුගිය වර්ෂ තුන තුළ වැයකළ මුදල කොපමණද;

(iii) එමගින් අත්කර ගත් ප්‍රතිඵල කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) ඩෙංගු මර්දනය සඳහා බීටීඅයි (BTI) බැක්ටීරියා ගෙන්වනු ලැබූ රටවල් කවරේද;

(ii) එම බැක්ටීරියා ගෙන්වීම සඳහා 2011, 2012 සහ 2013 වර්ෂවල දී වැය කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) බීටීඅයි බැක්ටීරියා ශ්‍රී ලංකාව තුළ නිපදවිය හැකිද;

(iv) එසේ කළ හැකි නම්, ශ්‍රී ලංකාව තුළ බීටීඅයි බැක්ටීරියා භාවිතයට නොගැනීමට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

4773/'14

ගරු අශෝක් අබේසිංහ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රෝහල්වල ඖෂධ හිඟයට පිළියමක් ලෙස ප්‍රාදේශීය වශයෙන් ඖෂධ මිලදී ගැනීම සඳහා අවසර දී තිබේද;

(ii) ඒ සඳහා මිල ගණන් ලබා ගන්නා ආකාරය කවරේද;

(iii) එම මිල ගණන් වෛද්‍ය සැපයුම් අංශය සමග සංසන්දනය කිරීමට වැඩ පිළිවෙළක් තිබේද;

(iv) පේරාදෙණිය මහ රෝහලේ ඖෂධ මිලදී ගැනීම්වලදී සිදු වී ඇති අක්‍රමිකතා පිළිබඳව අමාත්‍යාංශය දැනුවත් වී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5087/'14

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ස්ථිර ප්‍රාදේශීය ලේකම්වරයෙක් පත් කර නොමැති නිසා තම අවශ්‍යතා සපුරා ගැනීම සඳහා එම කාර්යාලයට පැමිණෙන ජනතාව බොහෝ දුෂ්කරතාවයන්ට මුහුණ දෙන බව එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට සහකාර ප්‍රාදේශීය ලේකම්වරයෙකු හෝ පත් කිරීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2014 නොවැම්බර් මස 04 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2742/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2011 වර්ෂයේ පැවති 05 වසර ශිෂ්‍යත්ව විභාගයෙන් සමත් සිසුන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් අතරින් ශිෂ්‍යාධාර ලබන සිසුන් සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වෙළඳපොළේ භාණ්ඩ මිල ඉහළයාමට සාපේක්ෂව ශිෂ්‍යත්වය විභාගය සමත් දරුවන්ට ප්‍රමාණවත් ශිෂ්‍යාධාර මුදලක් ලබා දෙන්නේද;

(iv) නොඑසේ නම්, එම ශිෂ්‍යාධාර මුදල වැඩිකරන්නේද;

(v) එසේ නම්, එම දිනය කවරේද;

(vi) එසේ වැඩි කිරීමට අපේක්ෂිත මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3548/'13

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2009 සිට 2013 දක්වා පසුගිය වර්ෂ පහ තුළ එක් එක් වර්ෂයේදී,

(i) භාණ්ඩාගාර බැඳුම්කර හෝ භාණ්ඩාගාර බිල්පත් මිලදී ගත් සමාගම්, ආයතන හෝ කර්මාන්ත ආයෝජකයන් කවරේද;

(ii) ඉහත කී ණය සාධනපත්‍ර විකුණන ලද මිල හා කාල පරිච්ඡේදය කවරේද;

(iii) විනිමය අනුපාතය ඉහළ යාමෙන් සිදුවන අලාභය රජය විසින් දරනු ලබන බවට ප්‍රකාශ කරමින් ඉහත කී භාණ්ඩාගාර බැඳුම්කර සහ භාණ්ඩාගාර බිල්පත් මිලදී ගත් පුද්ගලයන් සඳහා කිසියම් සහතිකයක් ලබා දී තිබේද;

(iv) රජයේ ණය සාධනපත්‍ර මිලදී ගැනීම සිදු කළ ප්‍රධානතම ආයෝජකයන් නැතහොත්, කර්මාන්ත ආයෝජකයන් පස් දෙනා කවුරුන්ද;

(v) කෙටි කාලීන, මධ්‍ය කාලීන සහ දිගු කාලීන වශයෙන් රජය විසින් විකුණන ලද සම්පූර්ණ ණය සාධනපත්‍ර සංඛ්‍යාව සහ ඒවායේ වටිනාකම හා ආයු කාලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4265/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දක්ෂිණ අධිවේගී මාර්ගය මාතර, ගොඩගම සිට හම්බන්තොට, මත්තල දක්වා දීර්ඝ කිරීමට කටයුතු කරන බවත්;

(ii) තිහගොඩ, කිරින්ද සහ දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට ආසන්නම දක්ෂිණ අධිවේගී මාර්ගයට පිවිසුම් ස්ථානය ලෙස අපරක්ක මාර්ගය යෝජනා කර මිනුම් කටයුතු පවා සිදුකර ඇති බවත්;

(iii) යෝජිත අපරක්ක පිවිසුම් මාර්ගය වෙනස් කර එය කිරින්ද-පුහුල්වැල්ල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ, වලකන්ද ප්‍රදේශයට ගෙනයාමට සැලසුම් කර ඇති බවත්;

(iv) පිවිසුම් මාර්ගය ඉහත (iii) හි සඳහන් පරිදි වෙනස් කිරීමකට ලක් වුවහොත් වැඩි ජන කොටසකට ප්‍රතිලාභ ලැබීමට ඇති අවස්ථාව අහිමි වන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) එසේ නම්, දක්ෂිණ අධිවේගී මාර්ගයට පිවිසුම් ස්ථානය ඉහත අ(iii)හි සඳහන් පරිදි වෙනස් නොකිරීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4578/'13

ගරු අනුර දිසානායක මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඕමන්තේ සිට කන්කසන්තුරේ දක්වා වූ දුම්රිය මාර්ගයේ මුළු දිග ප්‍රමාණය කොපමණද;

(ii) එම දුම්රිය මාර්ගය ඉදිකිරීම වෙනුවෙන් වැය වූ මුළු මුදල කොපමණද;

(iii) ඒ අනුව එම මාර්ගයේ එක් කිලෝ මීටරයක් ඉදිකිරීම වෙනුවෙන් වැය වී ඇති මුදල ආසන්න වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4678/'13

ගරු පී. හැරිසන් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ දුම් පානය නිසා දෛනිකව සහ වාර්ෂිකව මිය යන සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන්;

(ii) 2013 වර්ෂයේදී දුම් පානය නිසා මිය ගිය සංඛ්‍යාව;

(iii) දුම් පානය නිසා වාර්ෂිකව රෝගීවන සංඛ්‍යාව;

(iv) දුම් වැටි ආනයනය තුළින් රජය උපයනු ලබන වාර්ෂික ආදායම;

කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) පසුගිය වර්ෂ පහ තුළදී;

(i) දුම් පානය නිසා රෝගාතුර වී ඇති සංඛ්‍යාව;

(ii) දුම්වැටි ආනයනයෙන් රජය උපයා ඇති ආදායම;

කොපමණද යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) (i) දුම් පානය අවම කිරීම සඳහා රජය ගෙන ඇති පියවර කවරේද;

(ii) දුම් පානය නිසා සිදු වන හානිය දැක්වෙන දැන්වීම් ප්‍රදර්ශනය වන දුම් වැටි ඇසුරුම වෙළඳපොළට නිකුත් කරන දිනය කවරේද;

(iii) ඒ සඳහා බාධාවන් තිබේ නම්, ඒ කවරේද;

(iv) එවැනි දුම් වැටි ඇසුරුමක් හඳුන්වා දීම තුළින් දුම් වැටි භාවිතය අඩු කිරීමට හැකියාවක් තිබේද;

(v) එසේ නම්, ඒ කෙසේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

5145/'14

ගරු අනෝමා ගමගේ මහත්මිය,— සම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සිය ජීවිකාව වශයෙන් රන් හා රිදී ආභරණ සැකසීමේ කර්මාන්තයෙහි නිරතවන පිරිස් සිටින ප්‍රදේශ හෝ ගම්මාන හඳුනාගෙන තිබේද;

(ii) එසේ නම්, ඒවා කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් පිරිසට සිය කර්මාන්ත පවත්වාගෙන යෑම සඳහා ලබා දෙන ආධාර සහ ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වැඩසටහන් කවරේද;

(ii) එම කර්මාන්තකරුවන්ට අමුද්‍රව්‍ය (රන්, රිදී, මැණික් සහ වටිනා ගල් වර්ග ආදිය) ලබා ගැනීමට යම් පහසුකම් සලසා තිබේද;

(iii) එසේ නම්, එම පහසුකම් කවරේද;

(iv) ඉහත කර්මාන්තකරුවන් වෙත නිෂ්පාදන ඇනවුම් ලබා දීමේ යම් වැඩ සටහනක් තිබේද;

(v) දේශීය කර්මාන්තකරුවන්ගේ නිර්මාණ ප්‍රදර්ශනය හා අලෙවිය සඳහා වූ ලක්සල වැනි ආයතනවලට රන් / රිදී ආභරණ සැපයුම් කරනු ලබන ක්‍රමවේදය කවරේද ;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5148/'14

ගරු දුනේෂ් ගන්කන්ද මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික අධ්‍යාපන විද්‍යා පීඨ සඳහා වර්ෂයකට ඇතුළත් කර ගනු ලබන ගුරු අභ්‍යාස ලාභී ශිෂ්‍ය සංඛ්‍යාව ආසන්න වශයෙන් කොපමණද;

(ii) වර්ෂ 2009 සිට 2013 දක්වා එක් එක් වර්ෂයේදී අධ්‍යාපන විද්‍යා පීඨවල එක් ගුරු අභ්‍යාසලාභියෙකු වෙනුවෙන් ලබා දුන් මාසික දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2009 නොවැම්බර් මස 10 වැනි දින කහවත්ත, රුවන්පුර අධ්‍යාපන විද්‍යා පීඨයට පැමිණි ජනාධිපතිවරයා විසින් ඉහත දීමනාව රුපියල් පන්දහසක් දක්වා ඉහළ දැමීමට අවශ්‍ය පියවර ගන්නා බවට එම සිසුන් ඉදිරියේ ප්‍රසිද්ධ ප්‍රකාශයක් කළ බව දන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ජනාධිපතිතුමාගේ එම ප්‍රකාශයට අනුව අවම වශයෙන් ඉදිරි මාසයේ සිට හෝ ගුරු අභ්‍යාසලාභීන්ට ලබා දෙන දීමනාව රුපියල් පන්දහසක් දක්වා ඉහළ දැමීමට අවශ්‍ය පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5175/'14

ගරු අජිත් පී. පෙරේරා මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් පිරිපහදු අවශ්‍යතාව සපුරාලීම සඳහා සපුගස්කන්ද ඛනිජ තෙල් පිරිපහදුව ප්‍රමාණවත් වන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2010 සිට 2012 දක්වා කාලය තුළදී සපුගස්කන්ද තෙල් පිරිපහදුවේ පිරිපහදු ක්‍රියාකාරිත්වය සම්පූර්ණයෙන් නතර කරන ලද අවස්ථා කවරේද;

(ii) එම එක් එක් අවස්ථාවේ දී පිරිපහදු කටයුතු නවතා දැමූ කාල සීමාවන් කවරේද;

(iii) එසේ නතර කිරීමට හේතුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) සපුගස්කන්ද තෙල් පිරිපහදුව වසා දැමීමට තීරණයක් ගෙන තිබේද;

(ii) එසේ නම්, ඊට පදනම් වූ හේතු කවරේද;

(iii) නව තෙල් පිරිපහදුවක් ඉදිකිරීම සඳහා තීරණයක් ගෙන තිබේද;

(iv) අලුතින් තෙල් පිරිපහදුවක් ඉදිකිරීම රජයේ ප්‍රමුඛතාවයක් නොවීමට හේතුවන කරුණු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2014 නොවැම්බර් මස 05 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2744/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දකුණු පළාතේ ඇති රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල සිටින සුදුසුකම් සම්පූර්ණ කළ විදුහල්පතිවරුන් සංඛ්‍යාව සහ සුදුසුකම් නොලත් විදුහල්පතිවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) සුදුසුකම් සපුරා නැති වැඩබලන විදුහල්පතිවරු පත්කර ඇති පදනම කවරේද;

(iv) එම වැඩබලන විදුහල්පතිවරු සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(v) සුදුසුකම් සපුරා ඇති විදුහල්පතිවරුන් එම පාසල් සඳහා පත් කරන්නේද;

(vi) ඒ සඳහා ගතවන කාලය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3549/'13

ගරු රවී කරුණානායක මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2013 ජනවාරි 8 වැනි දින පාර්ලිමේන්තුවේදී දිවි නැගුම පනත් කෙටුම්පත සම්මත වූ අවස්ථාව වන විට සමෘද්ධි බැංකුවල පැවති මුළු ශේෂය කොපමණද;

(ii) සමෘද්ධි බැංකුවේ නම වෙනස් කර හෝ නව බැංකුවක් ස්ථාපිතකර හෝ තිබේද;

(iii) සමෘද්ධි බැංකුව ආරම්භ කළ දිනයේ සිට මේ දක්වා වාර්ෂික පදනමින් සෑම වර්ෂයකම ජනවාරි 1 වැනි දිනට සමෘද්ධි බැංකුවේ පැවති සමුච්චිත එකතුව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) තම ඉතිරි කිරීම් සමෘද්ධි බැංකුවේ තැන්පත් කිරීමට බල කරනු ලැබූ තැන්පත්කරුවන්ට එකී බැංකුවෙන් ගෙවන ලද පොලී අනුපාතිකයන් කවරේද;

(ii) ඔවුන් විසින් තැන්පත් කරන ලද ප්‍රාග්ධනය වෙනුවෙන් සමස්තයක් වශයෙන් ගෙවන ලද පොලිය කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4266/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සිංහරාජ වන රක්ෂිතය මායිමේ පිහිටි එන්සල්වත්ත ප්‍රදේශයේ ඉදිකර ඇති 'Rainforest Eco Lodge' නමැති හෝටලය හේතුවෙන් වන රක්ෂිතය විශාල පරිසර හානියකට ලක්වන බවත්;

(ii) එම හෝටලයෙන් ඉවතලන අපද්‍රව්‍ය වනාන්තරයට බැහැර කිරීම හේතුවෙන් වනාන්තරයේ ජීවත් වන සංවේදී පාංශු ජීවීන් හා ජලජ ජීවීන්ගේ පැවැත්මට දැඩි තර්ජනයක් එල්ල වී ඇති බවත්;

(iii) මෙවැනි හෝටල් ඉදිකිරීම සමස්ත වනාන්තර පද්ධතියේම පැවැත්ම කෙරෙහි දැඩි ලෙස බලපාන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, ඉහත සඳහන් හෝටලයෙන් පරිසරයට අයහපත් බලපෑම් සිදුවීම සහ වනාන්තර ආශ්‍රිතව හෝටල් ඉදිකිරීම වැළැක්වීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4469/'13

ගරු අනුර දිසානායක මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010, 2011 හා 2012 යන වර්ෂවලදී එක්සත් ජනපදයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය Qorvis Communications නමැති සමාගම සමග ගනුදෙනු කර තිබේද;

(ii) එසේ නම්, එම ගනුදෙනු සිදුවී ඇති දින වකවානු කවරේද;

(iii) එම ගනුදෙනු තුළින් ඉටුකර ගෙන ඇති කාර්යය හෝ කාර්යයන් කවරේද;

(iv) එමගින් ලැබී ඇති ප්‍රයෝජන කවරේද;

(v) එම කටයුතු වෙනුවෙන් කරන ලද ගෙවීම්වල වටිනාකම කොපමණද;

(vi) ඒ සඳහා මුදල් වෙන් කරනු ලැබූ වැය ශීර්ෂය කවරේද;

(vii) එම සමාගම සමග ගිවිසුම්වලට එළැඹ ඇත්නම්, එම ගිවිසුම් සභාගත කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5176/'14

ගරු අජිත් පී. පෙරේරා මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2005 සිට 2013 දක්වා කාලයට අදාළව ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් වාර්ෂික අවසාන ගිණුම් පිළියෙල කර තිබේද;

(ii) 2013 වර්ෂය තුළ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් වාර්තා කළ ශුද්ධ ලාභය හෝ අලාභය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5182/'14

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2013 වර්ෂයේ සිට 2014 වර්ෂයේ මුල් කාර්තුව දක්වා කාලය තුළ, දැයට කිරුළ, ගම නැගුම සහ වෙනත් සංවර්ධන වැඩ සටහන් යටතේ පඩුවස්නුවර ආසනය තුළ ප්‍රතිසංස්කරණය කළ වැව් හා වාරි කර්මාන්ත ව්‍යාපෘති කවරේද;

(ii) එම එක් එක් ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු කළ මුදල කොපමණද;

(iii) එම එක් එක් ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කළ හා අවසන් කළ දිනයන් කවරේද;

(iv) එම එක් එක් ව්‍යාපෘතිය නිම කරන විට වැය කර තිබූ මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත එක් එක් ව්‍යාපෘතියට අදාළ ඇස්තමේන්තුගත මූලික සැලැස්ම කවරේද;

(ii) එය අනුමත කළ හා ඒ අනුව ගෙවීම් අනුමත කළ ආයතන කවරේද;

(iii) එම ව්‍යාපෘති අධීක්ෂණය කරනු ලැබූ අය කවුරුන්ද;

(iv) ඉහත ව්‍යාපෘති අතරින් ඇස්තමේන්තුවට අනුව වැඩ නිම කළ හා එසේ නොකළ ව්‍යාපෘති වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) ඇස්තමේන්තුවට අනුව වැඩ නිම කිරීමට නොහැකිවූයේ නම්, එයට හේතු කවරේද;

(vi) එවැනි ව්‍යාපෘති සඳහා ගෙවීම් කර තිබේද;

(vii) එසේ නම්, එම ගෙවීම් අනුමත කර ඇති නිලධාරීන් කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5205/'14

ගරු තිස්ස අත්තනායක මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඕස්ට්‍රේලියාවේ, කැන්බරාහි, ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයට අමතරව, මෙල්බන් නුවර ශ්‍රී ලංකා කොන්සියුලර් ජනරාල් කාර්යාලයක් පවත්වාගෙන යනු ලබන්නේද;

(ii) එසේ නම්, එම කොන්සියුලර් ජනරාල් කාර්යාලය විවෘත කළ දිනය කවරේද;

(iii) මෙල්බන්හි, ශ්‍රී ලංකා කොන්සියුලර් ජනරාල් කාර්යාලයක් විවෘත කිරීමේ අරමුණු කවරේද;

(iv) මේ වන විට එම කාර්යාලය හරහා ශ්‍රී ලංකාවට ලැබී ඇති ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මෙල්බන්හි ශ්‍රී ලංකා කොන්සියුලර් ජනරාල් කාර්යාලයේ කොන්සල්වරයා වශයෙන් කටයුතු කරනු ලබන පුද්ගලයාගේ නම සහ වෘත්තීය සුදුසුකම් කවරේද;

(ii) එහි සේවය කරනු ලබන අනෙකුත් නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් එක් නිලධාරියාගේ නම, තනතුර, වෘත්තීය සුදුසුකම් සහ පැවරී ඇති වගකීම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) කොන්සල්වරයා ඇතුළු ඉහත නිලධාරීන්ට එක් එක් තනතුරු අනුව ගෙවනු ලබන වැටුප් ප්‍රමාණයන් කොපමණද;

(v) එම නිලධාරීන් සඳහා සපයා ඇති නිල රථ ඇතුළු අමතර පහසුකම් සහ දීමනා කවරේද;

(vi) එම කාර්යාලය සඳහා ශ්‍රී ලංකා රජය විසින් දරනු ලබන මුළු මාසික වියදම කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5418/'14

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල සඳහා බලපාන ව්‍යවස්ථාපිත නීතිය කවරේද;

(ii) එම නීතිමය තත්ත්වය යටතේ මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ නියාමන මණ්ඩලයේ සිටින සාමාජිකයින් කවුරුන්ද;

(iii) නීතිමය තත්ත්වය යටතේ අදාළ නියාමන මණ්ඩලය කොපමණ කාලයකට වරක් රැස් වන්නේද;

(iv) පසුගිය වසර තුළ මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ නියාමන මණ්ඩලය රැස් වී ඇති වාර ගණන කොපමණද;

(v) අදාළ රැස්වීම් වාර සඳහා ශිෂ්‍ය නියෝජිතයින්ගේ සහභාගීත්වයක් සිදු වී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ මුදල් පෞද්ගලික සමාගම්වල ආයෝජනය කර ඇත්නම්, එසේ කිරීමෙන් අපේක්ෂා කරන ප්‍රතිලාභය කවරේද;

(ii) එම ආයෝජන තුළින් යම් අලාභයක් සිදු වී ඇත්නම්, අදාළ අලාභය සඳහා වග කියනු ලබන අය කවුරුන්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2014 නොවැම්බර් මස 07 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2745/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දෙල්කඳ පොළ ආරම්භ කර මේ වන විට ගතවී ඇති වර්ෂ ගණන කොපමණද;

(ii) දෙල්කඳ පොළ පාලනය කරනු ලබන ආයතනය කවරේද;

(iii) දෙල්කඳ පොළ පවත්වාගෙන යන භූමියේ වර්තමාන අයිතිකරුවන් කවුරුන්ද;

(iv) මෙම පොළේ වෙළඳාම් කරන වෙළෙඳුන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) දෙල්කඳ පොළ ඉවත් කිරීමෙන් අසාධාරණයට ලක්වූ වෙළෙඳුන්ට සාධාරණයක් ඉටුකරන්නේද;

(ii) දෙල්කඳ පොළ ඉවත් කරන්නේ නම්, එයට ලබා දෙන විකල්පය කවරේද;

(iii) එම විකල්ප ක්‍රියාමාර්ගය සඳහා වැයවන මුදල කොපමණද;

(iv) එය ක්‍රියාත්මක කරන දිනය කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3550/'13

ගරු රවී කරුණානායක මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 වර්ෂය තුළදී සහ 2012 වර්ෂයේ සිට මේ දක්වා කාල පරිච්ඡේදය තුළදී ආයෝජන මණ්ඩලය හෝ වෙනත් කිසියම් රාජ්‍ය ආයතනයක් හරහා පුද්ගලික අංශයට සහ විදේශ ආයෝජකයන් වෙත ලබා දෙන ලද රජයේ ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එක් එක් ඉඩම ලබා ගත් පුද්ගලයා, එහි විකුණුම් මිල, භූමි ප්‍රමාණය, පිහිටි ස්ථානය සහ ඉඩම මිළදී ගැනීමේ අරමුණ වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) 2010 වර්ෂයේ සිට මේ දක්වා රජය විසින් ලබා දී ඇති එක් එක් ඉඩම තුළ අදාළ ව්‍යාපාර ආරම්භ කර තිබේද;

(iv) නොඑසේ නම්, එකී ව්‍යාපාර ආරම්භ කිරීමට ගනු ලබන කාලය කවරේද;

(v) ඉහත (i) පරිදි ලබා දුන් ඉඩම් තුළ සිදු කරන ව්‍යාපාරයන්ට අදාළ ආයෝජනයේ මුළු වටිනාකම සහ රැකියා උත්පාදනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4267/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සිංහරාජ වනාන්තරය අවට පදිංචිකරුවන් එහි රක්ෂිත ප්‍රදේශ සීඝ්‍රයෙන් එළි පෙහෙළි කරමින් අනවසරයෙන් තේ වගාව සිදු කරන බවත්;

(ii) එම හේතුව නිසා ලෝක උරුමයක් වන සිංහරාජ වනාන්තරය සීඝ්‍රයෙන් කුඩා වන බවත්;

(iii) රක්ෂිතය වටා පිහිටා ඇති ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් වනාන්තර සිංහරාජ වන රක්ෂිතයට පවරා ගැනීම තුළින් මෙම තත්ත්වය පාලනය කිරීම සිදුකළ හැකි බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) එසේ නම්, ඉහත අ(iii) හි සඳහන් ඉඩම් සිංහරාජ රක්ෂිතයට පවරා ගැනීමට කටයුතු කරන්නේදැයි එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) සිංහරාජ රක්ෂිතයට අයත් මාණික්කවත්ත ප්‍රදේශයේ අක්කර 300 ක පමණ වනාන්තර ප්‍රදේශයක් ගුරුගේ මැණික් නමැති ව්‍යාපාරයේ හිමිකරු විසින් බලහත්කාරයෙන් අත්පත් කර ගෙන මැණික් ගැරීමට සූදානම් වන බව දන්නේද;

(ii) එවැනි කටයුත්තක් සිදු වුවහොත්, රක්ෂිතය තුළ පාරිසරික ගැටලු රැසක් ඇතිවන බව පිළිගන්නේද;

(iii) එසේ නම්, එම තත්ත්වය නවතාලීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4579/'13

ගරු අනුර දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ කැසිනෝ සූදුව වෙනුවෙන් 2012 සිට මේ දක්වා නිකුත් කර ඇති බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

(ii) එම බලපත්‍රලාභීන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iii) එම කැසිනෝශාලා පවත්වාගෙන යනු ලබන ප්‍රදේශ කවරේද;

(iv) මේ වන විට බලපත්‍ර රහිත කැසිනෝශාලා පවත්වාගෙන යනු ලබන බවට වාර්තා වී තිබේද;

(v) එසේ නම්, එම කැසිනෝශාලා සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4774/'14

ගරු අශෝක් අබේසිංහ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ ප්‍රධාන ඖෂධ කලාපය තුළ දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්තුවක් ලබා දී තිබේද;

(ii) එම කොන්ත්‍රාත් සමාගමේ නම කවරේද;

(iii) එම සමාගම සඳහා ලබා දී තිබූ කොන්ත්‍රාත්තුවේ වටිනාකම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5099/'14

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නියං කාලවල දී රජරට ගොවීන් ජලය හිඟකම නිසා සිය වගා කටයුතු කරගත නොහැකි තත්ත්වයකට පත් වී ඇති බව දන්නේද;

(ii) මහින්ද චින්තන ඉදිරි දැක්මේ පිටු අංක 21 හි සඳහන් පරිදි භූගත ජල මට්ටම රඳවා තබා ගැනීමට හැකි අයුරින් සෑම වැවක්ම සංරක්ෂණය කිරීමේ වැඩ සටහන ක්‍රියාත්මක කර තිබේද;

(iii) එම වැඩ සටහන යටතේ සංරක්ෂණය කළ වැව් කවරේද;

(iv) නියං කාලවලදී ගොවීන් මුහුණ දෙන ජල ප්‍රශ්නය විසඳීම සඳහා වැසි ජලය ආරක්ෂා කිරීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5206/’14

ගරු තිස්ස අත්තනායක මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කොලොන්නාවේ සිට මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපළ දක්වා ගුවන් යානා ඉන්ධන ප්‍රවාහනය කරමින් තිබූ අංක LY5467 දරන බවුසර රථය 2014 අප්‍රේල් 12 වැනි දින අලුයම 1.30ට පමණ සූරියවැව, මීගහජඳුර මංසන්ධියේදී අනතුරකට ලක්වී ගිනි ගෙන විනාශ වූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ඉන්ධන බවුසරය ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සතුව තිබුණේද;

(ii) එය පුද්ගලික හිමිකරුවකු සතු වූයේ නම්, එම හිමිකරුගේ නම සහ ලිපිනය කවරේද;

(iii) එම බවුසරය තුළ ප්‍රවාහනය කරමින් තිබූ ඉන්ධන ලීටර් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ගිනි ගැනීමට ලක් වූ එම බවුසරයේ ගින්න නිවා දැමීම සඳහා ගිනි නිවන රථ පැමිණියේද;

(ii) එසේ නම්, එම රථ පැමිණි වේලාව සහ එම ගිනි නිවීමේ රථ අයත් වූ ආයතන කවරේද;

(iii) අදාළ රථය ගිනි ගැනීමට ලක් වූ ස්ථානයට ආසන්නතම ගිනි නිවීමේ ඒකක පවත්නා ආයතන සහ ස්ථාන කවරේද;

(iv) ඉහත (i) ට අදාළව ගින්න නිවා දැමීම සඳහා මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපළෙහි ගිනි නිවීමේ ඒකකය නොකැඳවීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

5260/’14

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දෙල්තොට නගරයේ සිට දෙල්තොට රජයේ රෝහල, මලෙයිමගල් හින්දු මධ්‍ය මහා විද්‍යාලය හා දෙල්තොට මුස්ලිම් මධ්‍ය මහා විද්‍යාලය යන ස්ථාන සඳහා පිවිසීමට ඇති ප්‍රධාන මාර්ගය දිගු කලක සිට ප්‍රතිසංස්කරණය නොකිරීමෙන් අබලන්ව ඇති බවත්;

(ii) අබලන්ව ඇති මාර්ගය භාවිතා කරන ජනතාවට දැඩි දුෂ්කරතාවලට මුහුණ දීමට සිදුවී ඇති බවත්;

එතුමා දන්නෙහිද ?

(ආ) දෙල්තොට ප්‍රදේශවාසීන්ගේ සුබසිද්ධිය උදෙසා ඉහත මාර්ගය ඉතා ඉක්මණින් ප්‍රතිසංස්කරණයකර දීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2014 නොවැම්බර් මස 08 වැනි සෙනසුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2746/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දැනට ක්‍රියාත්මකවන දේශීය ශල්‍ය ගෝස් කර්මාන්තශාලා සංඛ්‍යාව කොපමණද;

(ii) මෙම කර්මාන්තශාලාවල සේවයේ නියුතු සේවකයින් සංඛ්‍යාව කොපමණද;

(iii) රජයේ රෝහල් සඳහා දේශීය නිෂ්පාදකයින්ගෙන් මිලදී ගනු ලබන ශල්‍ය ගෝස් ප්‍රමාණය කොපමණද;

(iv) රජයේ රෝහල්වලට දේශීය ශල්‍ය ගෝස් නිෂ්පාදන මිලදී ගැනීම කප්පාදු කිරීම නිසා බිඳ වැටෙමින් පවතින එම කර්මාන්තය රැකගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3551/'13

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හිටපු අගවිනිසුරුවරියට එරෙහි දෝෂාභියෝගය විභාග වන අවස්ථාවේ ගෝල්ඩන් කී සහ අසාර්ථක සෙලින්කෝ පරිපාලිත සමාගම්වලට වන්දි ලබා දෙන බවට මුදල් සහ ක්‍රම සම්පාදන ඇමතිතුමා කළ ප්‍රකාශය නිවැරදිද;

(ii) එසේ නම්, වන්දි ලබා දීම සිදුකළ හෝ සිදු කිරීමට අපේක්ෂිත දිනය කවරේද;

(iii) ඉහත සමාගම්වල තැන්පත්කරුවන්ට නොගෙවන ලද මුළු මුදල් ප්‍රමාණය කොපමණද;

(iv) එම සමාගම්වල වත්කම් සහ සංචිතවලින් ගෙවීමට හැකි ප්‍රතිශතය කොපමණද;

(v) විකුණා දැමූ එක් එක් සමාගමේ නම සහ එය අලෙවි කිරීමෙන් ලැබූ මුදල් ප්‍රමාණය කොපමණද;

(vi) ඉතිරි ගෙවීම් කිරීම සඳහා වන සැලසුම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) "ගෝල්ඩන් කී" සමාගම සහ අසාර්ථක සෙලින්කෝ පරිපාලිත සමාගම් සහ සෙලින්කෝ සමූහ ව්‍යාපාරයේ අනෙකුත් සමාගම් යටතේ පැවති ආයතනවල නම් කවරේද;

(ii) මෙම එක් එක් සමාගම විකුණනු ලැබූ වටිනාකම කොපමණද;

(iii) තක්සේරුකරු කවුරුන්ද;

(iv) එම සමාගම් බිඳවැටෙන දිනය වන විට අවසන් ශේෂ පත්‍ර ඉදිරිපත් කරන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4268/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උතුරු මැද පළාතේ සුවිශේෂී පරිසර පද්ධතියක් සහිත පදවිය වනාන්තරය රක්ෂිතයක් බවට ගැසට් නිවේදනයක් මගින් ප්‍රකාශයට පත් කර ඇති බවත්;

(ii) එසේ කිරීමට හේතුව එහි ඇති සුවිශේෂී වැදගත්කම බවත්;

(iii) එම රක්ෂිතයෙන් ඉඩම් හෙක්ටයාර් 12900 ක කොටසක් නැවත පදිංචි කිරීමේ හා සංවර්ධනය කිරීමේ කටයුතු සඳහා ගැසට් පත්‍රයක් මගින් නැවතත් පවරා ගැනීමට කටයුතු කරමින් සිටින බවත්;

(iv) ඉහත (iii) හි සඳහන් පරිදි එම රක්ෂිතයෙන් කොටසක් අහිමිවීම ප්‍රදේශයේ කාලගුණික හා දේශගුණික වෙනස්කම් රැසක් ඇති වීම කෙරෙහි බල පෑ හැකි බවත්;

(v) එම තත්ත්වය පදවිය වැව ප්‍රධාන කොටගත් වැව් පද්ධතියේ පැවැත්ම කෙරෙහිද දැඩි ලෙස බලපෑම් එල්ල කළ හැකි බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) එසේ නම්, එම තත්ත්වය වළක්වා ගැනීම සඳහා කඩිනමින් පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4580/'13

ගරු අනුර දිසානායක මහතා,— ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගියදා පැවති පොදු රාජ්‍ය මණ්ඩලීය නායක සමුළුව වෙනුවෙන් ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය හා ඊට අදාළ අනෙකුත් ආයතන විසින් දරන ලද මුළු වියදම් ප්‍රමාණය කොපමණද;

(ii) එම මුදල් සපයා ගනු ලැබූ ආකාරය කවරේද;

(iii) එම මුදල් වැය කරන ලද ආකාරය කවරේද;

(iv) එම සමුළුවේ මාධ්‍ය ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් දැරූ වියදම කොපමණද;

(v) ප්‍රචාරණ කටයුතු ලබා දුන් විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය කවරේද;

(vi) එම එක් එක් මාධ්‍ය ආයතනය වෙනුවෙන් ගෙවන ලද මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4679/'13

ගරු පී. හැරිසන් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් උතුරු මැද පළාතේ වකුගඩු ප්‍රශ්නය විසඳීම සඳහා පත් කරනු ලැබූ විද්වත් කමිටුවට තෝරා ගත් අයගේ නම්, තනතුරු හා ආයතන කවරේද;

(ii) එම කමිටුව පත් කරනු ලැබූ දිනය කවරේද;

(iii) එම කමිටුව මේ වන විට රැස් වී ඇති වාර ගණන කොපමණද;

(iv) එහි අවසන් වාර්තාව භාර දෙනු ලැබූ දිනය කවරේද;

(v) එම කමිටුව විසින් එකී වාර්තාව භාර දෙනු ලැබූ අය කවුරුන්ද;

(vi) එම වාර්තාවේ කරුණු ක්‍රියාත්මක කිරීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත වාර්තාවේ නිර්දේශවල සඳහන් පරිදි කෘෂි රසායනික ද්‍රව්‍ය 4ක භාවිතය තහනම් කරනු ලැබුවේද;

(ii) එසේ තහනම් කරන ලද කෘෂි රසායනික ද්‍රව්‍ය මේ වනවිටත් වෙළඳපොළේ විකිණීමට තිබේද;

(iii) 2013 වර්ෂයේ දී ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද පළිබෝධ නාශක කවරේද;

(iv) ආනයනය කළ එම එක් එක් පළිබෝධ නාශක වර්ගයේ ප්‍රමාණ වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඒවායේ ප්‍රමිතිය පරීක්ෂා කරනු ලැබුවේද;

(vi) එසේ නම්, පරීක්ෂා කරනු ලැබූ රසායනාගාරය හා ස්ථානය කවරේද;

(vii) ඉහත සඳහන් පරිදි ප්‍රමිති පරීක්ෂාවක් සිදු නොකළේ නම්, එයට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4775/'14

ගරු අශෝක් අබේසිංහ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති ලියාපදිංචි ඖෂධ අලෙවිසැල් සංඛ්‍යාව කොපමණද;

(ii) මෙරට සිටින ලියාපදිංචි ඖෂධවේදීන් සංඛ්‍යාව සහ ඖෂධ බෙදාහරින්නන් සංඛ්‍යාව කොපමණද;

(iii) අප රටට අවශ්‍ය ඖෂධවේදීන්ගේ සංඛ්‍යාව කොපමණද;

(iv) ඖෂධවේදීන් පුහුණු කිරීම සඳහා ක්‍රමවේදයක් ක්‍රියාත්මක වේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5100/'14

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දේශීය පොල් නිෂ්පාදනය පහත වැටීම සඳහා මයිටා උවදුර දැඩි ලෙස බලපා තිබේද;

(ii) වර්ෂ 2010 සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ වාර්ෂික පොල් ඵලදාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) පසුගිය වර්ෂ පහ තුළ වාර්ෂිකව අපනයනය කළ පොල් ගෙඩි සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම කාල සීමාව තුළ දී පොල් ගෙඩි අපනයනයෙන් වාර්ෂිකව ලැබූ ආදායම කොපමණද;

(v) එම එක් එක් වර්ෂයේදී පැවති පොල් වගා කළ බිම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පසුගිය වර්ෂ තුන තුළ පොල් වගාවේ දියුණුව සහ එම වගාව මුහුණ දෙන උවදුරු සඳහා අවශ්‍ය පර්යේෂණ කටයුතු සිදු කිරීමට පොල් පර්යේෂණ ආයතනය වෙත රජය සහ රාජ්‍ය නොවන ආයතන මගින් ලබා දුන් ප්‍රතිපාදන කවරේද;

(ii) පොල් වගාවේ දියුණුව සඳහා එම ආයතනය මගින් සිදු කරන ලද නව පර්යේෂණ කවරේද;

(iii) අදාළ පර්යේෂණ මගින් ලබා දී ඇති නිර්දේශයන් කවරේද;

(iv) පොල් අපනයනය ඉහළ දැමීම හා දියුණු කිරීම සඳහා එම නිර්දේශයන් ක්‍රියාත්මක කරන දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5183/'14

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) වැඩ අවසන්ව ඇති නොරොච්චෝල ගල් අඟුරු තාප බලාගාරයේ මෙගාවොට් 300ක ධාරිතාව සහිත පළමුවැනි අදියරේ වර්තමාන මෙහෙයුම් කටයුතු සහ නඩත්තු කටයුතු සිදු කරන සමාගම කවරේද;

(ii) එම වගකීම පවරනු ලැබූ දිනය කවරේද;

යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත බලාගාරයේ මෙහෙයුම් කටයුතු සහ නඩත්තු කටයුතු ඉදිරියට පවත්වාගෙන යාම සඳහා එහි ඉදිකිරීම් කටයුතු සිදු කළ චීන සමාගමට පැවරීමට කටයුතු යොදා තිබේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) මෙම බලාගාරයේ 2 වැනි සහ 3 වැනි අදියරයන්හි වැඩ කටයුතු නිම කිරීමට නියමිතව ඇති දින වකවානු කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2014 නොවැම්බර් මස 10 වැනි සඳුදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2747/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කෑගල්ල දිස්ත්‍රික්කයේ, යටියන්තොට පානීය ජල ව්‍යාපෘතිය සඳහා වැයකළ මුදල කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) යටියන්තොට පානීය ජල ව්‍යාපෘතිය අසාර්ථක ව්‍යාපෘතියක් බවත්;

(ii) එම ව්‍යාපෘතිය යටතේ නිසිපරිදි පිරිසිදු කිරීමෙන් තොරව ලබාදෙන ජලය සඳහා ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ගාස්තු අයකරන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) ජල පෙරීමේ යන්ත්‍ර සවිකර නොමැති මෙම පොම්පාගාරයේ අපිරිසිදු ජලය ප්‍රදේශවාසී ජනතාවට පානීය ජලය ලෙස බෙදාහැර ඒ සඳහා ජල ගාස්තු අයකිරීමේ අසාධාරණ ක්‍රියාව වැළැක්වීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3552/'13

ගරු රවී කරුණානායක මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අද වන විට දිවයිනේ තිබෙන අනාරක්ෂිත දුම්රිය ගේට්ටු සංඛ්‍යාව කොපමණද;

(ii) වඩා ආරක්ෂිත ක්‍රම යොදාගැනීම මගින් අනාරක්ෂිත දුම්රිය ගේට්ටු සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීමට නොහැකි මන්ද;

(iii) ඉහත කී අනාරක්ෂිත දුම්රිය ගේට්ටුවල සේවයේ යෙදී සිටින පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(iv) එබඳු අනාරක්ෂිත දුම්රිය ගේට්ටු සඳහා වසරකට දරන මුළු වාර්ෂික පිරිවැය කොපමණද;

(v) 2010 සිට අද දක්වා මෙම අනාරක්ෂිත දුම්රිය ගේට්ටු ආශ්‍රිතව සිදුවී ඇති මරණ සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4323/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— වනජීවි සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මොල්ලිකුලම් - සිලාවතුර මාර්ගය ඉදිකිරීම සඳහා අවශ්‍ය බොරලු ලබා ගැනීමට මහා පරිමාණයේ බොරලු කැපීමක් විල්පත්තු ජාතික වනෝද්‍යානයේ, කළාප අංක 4 ට අයත් බොරලුවල ප්‍රදේශයේ සිදු කරන බවත්;

(ii) තන්තිරිමලේ වන අඩවි කාර්යාලයේ අඩවි ආරක්ෂක නිලධාරියාගේ අනුග්‍රහය මේ සඳහා ලැබෙන බවට ප්‍රදේශයේ ජනතාව චෝදනා කරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) 1937 අංක 02 දරන වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 3, 5, 6 වගන්ති සියල්ලම ඉහත (අ) (i)හි සඳහන් ක්‍රියාව නිසා උල්ලංඝනය වන බව පිළිගන්නේද;

(ii) එසේ නම්, මාග ඉංජිනේරු පුද්ගලික සමාගමට ඉහත ප්‍රදේශයේ බොරලු කැපීම සඳහා නිර්දේශ ලබා දුන් අය කවුරුන්ද;

(iii) විල්පත්තු ජාතික වනෝද්‍යානයේ පරිසරයට විශාල හානියක් වන එම ක්‍රියාවලිය වහාම නතර කිරීම සඳහා කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4581/'13

ගරු අනුර දිසානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2011 සහ 2012 වර්ෂවල රාජ්‍ය ආදායම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම වර්ෂ දෙක වෙනුවෙන් රජය ගෙන තිබෙන ණය සඳහා ගෙවන ලද පොලී ප්‍රමාණය හා ණය වාරිකය වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම වර්ෂ වෙනුවෙන් ගෙවන ලද ණය වාරික හා පොලී වාරිකවල එකතුව වාර්ෂික රාජ්‍ය ආදායමේ ප්‍රතිශතයක් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5177/'14

ගරු අජිත් පී. පෙරේරා මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ධීවර ජනතාවට ලබා දුන් ඉන්ධන සහනාධාරය ක්‍රියාත්මක කිරීම තුළ වංචාවක් සිදු වී තිබේද;

(ii) ඉන්ධන සහනාධාරය ලබා දීමේ ක්‍රියාවලිය තුළ රුපියල් මිලියන 500ක මුදලක් වංචාකර ඇති බවට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ කළමණාකාර අධ්‍යක්ෂවරයා විසින් මාධ්‍ය වෙත කරන ලද ප්‍රකාශයේ සත්‍යතාවයක් තිබේද;

(iii) එවැනි වංචාවක් සිදු වී ඇත්නම්, ඒ පිළිබඳව පොලිසිය වෙත පැමිණිලි කර තිබේද;

(iv) එම පරීක්ෂණවල ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5198/'14

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා මිරර් (Sri Lanka Mirror) නමැති වෙබ් අඩවිය ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශයේ ලියාපදිංචි කර තිබේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) එම ලියාපදිංචිය සඳහා අය කරන ලද ගාස්තු කවරේද;

(iv) නියමිත පරිදි ලියාපදිංචි කර ඇති එම වෙබ් අඩවිය පවත්වාගෙන යන ස්ථානය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් පරීක්ෂාවට ලක් කර, එහි තිබූ පරිගණක ඔවුන්ගේ භාරයට ගෙන තිබේද;

(v) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ ඉහත ක්‍රියා කලාපයට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කළ මූලික අයිතිවාසිකම් නඩු 2කට අදාළව ලබා දී ඇති තීන්දුවකට අනුව, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව භාරයට ගත් පරිගණක ශ්‍රී ලංකා මිරර් ආයතනයට ආපසු භාර දී තිබේද;

(ii) ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශයේ ලියාපදිංචි පුවත් වෙබ් අඩවියකට අන්තර්ජාල පහසුකම් සපයන ආයතනවල සේවා අඩාලවීම නිරන්තරවම සිදු වන්නේ නම්, අමාත්‍යාංශයට ගත හැකි ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5261/'14

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බේරුවල නගර සභාවට අයත්, බේරුවල, මරදාන අරාබි මාර්ගය මේ වන විට දැඩි ලෙස අබලන්ව ඇති බවත්;

(ii) වැසි කාලයේදී එම මාර්ගයේ ඇති වලවල්වල වතුර පිරී මඩ වන තත්ත්වයක් පවතින බැවින් එම මාර්ගය භාවිතාකරන ප්‍රදේශයේ ජනතාව මහත් දුෂ්කරතාවයන්ට මුහුණ දෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එම ප්‍රදේශයේ ජීවත්වන ජනතාවගේ සුබසිද්ධිය උදෙසා ඉහත සඳහන් මාර්ගය කඩිනමින් ප්‍රතිසංස්කරණය කර දීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5420/'14

ගරු අජිත් කුමාර මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මොණරාගල දිස්ත්‍රික්කයේ, කුඹුක්කන් ඔය හරස් කර අක්කර 800ක ජලාශයක් ඉදිකිරීමට කටයුතු යොදා ඇති බවත්;

(ii) එම ජලාශය ඉදිකිරීම හේතුවෙන් මොණරාගල දිස්ත්‍රික්කයේ ගම්මිරිස් හා රබර් වගාවට දැවැන්ත බලපෑමක් සිදු වන බවත්;

(iii) එම නිසා එම ප්‍රදේශයේ ජනතාවගේ ආර්ථික ක්‍රියාවලිය ඇන හිටින බවත්;

(iv) ජලාශය ඉදිකිරීම නිසා ප්‍රදේශයේ දැවැන්ත වන හානියක් හා පරිසර හානියක් සිදුවන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ජල යෝජනාක්‍රමයේ අපේක්ෂිත අරමුණු හා ඉලක්ක කවරේද;

(ii) එම ජලාශය ඉදිකිරීමෙන් ලබා කර ගැනීමට අපේක්ෂිත සංවර්ධනය කවරේද;

(iii) මෙම යෝජනාක්‍රමය සඳහා වැය වන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2014 නොවැම්බර් මස 11 වැනි අඟහරුවාදා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2752/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මන්නාරම් දිස්ත්‍රික්කයේ, මඩු ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ පිහිටි, මඩුපාර අභය භූමියට අයත් මුළු බිම් ප්‍රමාණය කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් අභය භූමියේ සිදුකරන පස් කපා ඉවත් කිරීම නිසා වන සතුන්ට හා වනාන්තරයට හානි සිදුවන බවත්;

(ii) මේ වන විට අභය භූමි බල ප්‍රදේශයේ අක්කර 10 ක පස් කපා ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) මඩුපාර අභය භූමි බල ප්‍රදේශයේ සිදුකරනු ලබන ඉහත සඳහන් පස් කැපීම නතර කිරීමට කටයුතු කරන්නේද;

(ii) එම පස් කැපීමට අනුබල දුන් අයට හා පස් කපන ලද අයට එරෙහිව ගන්නා වූ ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3553/'13

ගරු රවී කරුණානායක මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් අක්කර ගණන දිස්ත්‍රික් පදනමින් කොපමණද;

(ii) එම ඉඩම් වාණිජමය සංවර්ධන කටයුතු සඳහා යොදාගත හැකිද;

(iii) නොඑසේ නම්, අධික වටිනාකමකින් යුත් එම ඉඩම් වාණිජ කටයුතු සඳහා යොදා නොගන්නේ මන්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් කිසියම් ඉඩමක් පෞද්ගලික අංශයට හෝ වෙනත් පෞද්ගලික සමාගමකට ලබා දී තිබේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ඉහත (ආ) යටතේ සඳහන් කර ඇති පරිදි ඉඩම් ලබාදී තිබේ නම්,

(i) එසේ ලබාදී ඇති එක් එක් ඉඩමෙහි ප්‍රමාණය පර්චස් හෝ අක්කරවලින් කොපමණද;

(ii) එම එක් එක් ඉඩමෙහි මිල කොපමණද;

(iii) එකී ඉඩම් කවර කාල පරිච්ඡේදයක් සඳහා ලබා දී තිබේද;

(iv) එකී ඉඩම් ලබාදීමට අදාළ ගනුදෙනුවෙහි ස්වභාවය කවරේද (ලබාදුන්නේ ඉල්ලීම පරිදිද; එසේ නොමැතිවද යන්න);

(v) එකී ඉඩම් කවර පුද්ගලයෙකුට ලබාදුන්නේද;

(vi) එකී ඉඩම් භාවිතා කරනු ලබන කාර්යය කවරේද;

යන්න එතුමා එක් එක් ඉඩම පදනමින්, වෙන් වෙන් වශයෙන් මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4425/'13

ගරු රෝසි සේනානායක මහත්මිය,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරය 2013 වර්ෂයේ අගෝස්තු මාසයෙන් පසු ක්‍රියා විරහිත කර තිබේද;

(ii) ක්‍රියා විරහිත කිරීමෙන් ඇති වූ විදුලි උත්පාදන හිඟය පිරිමසා ගැනීමට ගනු ලැබූ පියවර කවරේද;

(iii) එවැනි ක්‍රියා විරහිතවීමක් හේතුවෙන් විදුලිබල මණ්ඩලයට සිදුවූ පාඩුව කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4433/'13

ගරු තලතා අතුකෝරල මහත්මිය,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) ඉන්දීය ආරක්ෂක අමාත්‍යවරයා විසින් ලෝක් සභාවේදී සිදුකර ඇති ප්‍රකාශයකට අනුව ඉන්දියාව විසින් ශ්‍රී ලංකාවෙන් අවි මිලදී ගැනීමක් සිදුකර තිබේද;

(ii) එසේ නම්, එම අවි ගනුදෙනුව සිදු කර ඇති දින වකවානු කවරේද;

(iii) ඉන්දියාව විසින් එසේ මිලදී ගනු ලැබ ඇති ආයුධ වර්ග කවරේද;

(iv) එම ආයුධ අලෙවි කිරීම මගින් ශ්‍රී ලංකාව ලැබූ ආදායම කොපමණද;

(v) එම ගනුදෙනුවල විනිවිදභාවය තහවුරු කෙරෙන වාර්තාව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4473/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර, උයන්වත්ත ක්‍රීඩාංගනය දිස්ත්‍රික් සහ සමස්ත ලංකා මට්ටමේ ක්‍රීඩා තරග පැවැත්වීමට යොදා ගන්නා පොදු ක්‍රීඩාංගනයක් බවත්;

(ii) මාතර නගරවාසීන් බොහෝ පිරිසක් දෛනිකව ශාරීරික සුවතා සඳහා එම ක්‍රීඩාංගනය භාවිතා කරන බවත්;

(iii) මාතර මහ නගර සභාව මගින් එම ක්‍රීඩාංගනය ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට විකිණීම සඳහා කටයුතු කරමින් සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ක්‍රීඩාංගනය ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට විකුණනු ලැබුවහොත්, එම ප්‍රදේශයේ ජනතාවට අපහසුතා රැසකට මුහුණදීමට සිදු වන බව පිළිගන්නේද;

(ii) එසේ නම්, එකී ක්‍රීඩාංගනය විකිණීමේ ක්‍රියාවලිය නවතාලීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4505/’13

ගරු සුජීව සේනසිංහ මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පොදුරාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක සමුළුව (CHOGM) සඳහා සහභාගී වූ රාජ්‍ය නායකයින් හා අමුත්තන් වෙනුවෙන් වෙන් කර තිබූ සංචාරක හෝටල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ සඳහා වැය කළ මුළු මුදල කොපමණද;

(iii) එකී සමුළුවට සහභාගී වූ අමුත්තන් වෙනුවෙන් ආහාර සැපයීම සිදු කළ හෝටල් සංඛ්‍යාව කොපමණද;

(iv) ඒ සඳහා වැය වූ මුළු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5149/’14

ගරු දුනේෂ් ගන්කන්ද මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) බලංගොඩ මැතිවරණ කොට්ඨාසයේ, ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පඹහින්න, කුඹල්ගම, මුත්තෙට්ටුවෙගම, දියවර ගම්මානය සහ කිංචිගුණේ යන ගම්මානවල පදිංචි ජනතාව දීර්ඝ කාලයක් තිස්සේ උග්‍ර පානීය ජල හිඟයකට මුහුණ දී සිටින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ප්‍රදේශවල ජනතාව මුහුණදෙන පානීය ජල ගැටලුව විසඳීම සඳහා රජය මගින් ගෙන ඇති පියවර කවරේද;

(ii) එම ගැටලුව විසඳීම සඳහා දැනට ගෙන ඇති පියවර ප්‍රමාණවත් වී නොමැති බව පිළිගන්නේද;

(iii) එසේ නම්, එම ජනතාවගේ පානීය ජල ගැටලුව විසඳීම සඳහා ප්‍රමාණවත් වැඩ පිළිවෙළක් ඇරඹීම කෙරෙහි අවධානය යොමු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5208/’14

ගරු තිස්ස අත්තනායක මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව නියෝජනය කරමින් මහ කොමසාරිස් කාර්යාල පවත්වාගෙන යනු ලබන රටවල් සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වන විට පත් කර ඇති මහ කොමසාරිස්වරුන්ගේ නම් සහ වෘත්තීය සුදුසුකම් කවරේද;

(iii) මහ කොමසාරිස් තනතුරුවලට අනුයුක්ත කර ඇති ශ්‍රී ලංකා විදේශ සේවයට අයත් නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iv) ඉහත (i) හි සඳහන් මහ කොමසාරිස් කාර්යාල සඳහා ශ්‍රී ලංකා රජය විසින් මාසිකව දරනු ලබන මුළු වියදම කොපමණද;

(v) ශ්‍රී ලංකාව නියෝජනය කෙරෙන කොන්සියුලර් ජනරාල් කාර්යාල පිහිටුවා ඇති රටවල් සංඛ්‍යාව කොපමණද;

(vi) එම රටවල් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2014 නොවැම්බර් මස 12 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2754/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2012 මැයි මාසය තුළ ශ්‍රී ලංකාවේ විදේශ ඇමතිවරයා ඇමරිකා එක්සත් ජනපදයේ සංචාරය කළේද;

(ii) එසේ නම්, එම දින වකවානු කවරේද;

(iii) එම සංචාරයට සහභාගි වූ සෙසු අය කවුරුන්ද;

(iv) එම සංචාරය තුළදී ඇමරිකානු රාජ්‍ය ලේකම් හිලරි ක්ලින්ටන් මහත්මිය සමඟ හමුවක් පැවැත්වූයේද;

(v) එහිදී උගත් පාඩම් සහ ප්‍රතිසංධාන කොමිෂන් සභා වාර්තාවේ නිගමනයන් සහ වගකීම් පිළිබඳ "ක්‍රියාකාරී සැලැස්මක්" අමෙරිකානු රාජ්‍ය ලේකම් වෙත භාර දෙනු ලැබුවේද;

(vi) එසේ නම්, එම ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් ප්‍රධාන කොටස් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3554/'13

ගරු රවී කරුණානායක මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2010 වර්ෂයේ සිට මේ දක්වා,

(i) ශ්‍රී ලංකාවේ විවෘත කරන ලද පූර්ණ සංකලිත ටින් මාළු කර්මාන්තශාලා ගණන කොපමණද;

(ii) එකී කර්මාන්තශාලා විසින් පූර්ණ ශ්‍රී ලාංකික සංකලිත ක්‍රියාවලියක් අනුගමනය කරනු ලබන්නේද, නැතහොත්, අපනයනය සඳහා පමණක් ටින් මාළු ඇසුරුම් කිරීම සිදු කරනු ලබන්නේද;

(iii) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මකව පවතින එක් එක් ටින් මාළු කර්මාන්තශාලාවෙහි ආයෝජන වටිනාකම සහ රැකියා උත්පාදනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එක් එක් කර්මාන්තශාලාව නිපදවනු ලබන ටින් මාළු ප්‍රමාණය මෙට්‍රික් ටොන්වලින්, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ශ්‍රී ලංකාවට ටින් මාළු ආනයනය කරනු ලබන ප්‍රධාන රටවල් කවරේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3961/13

ගරු බුද්ධික පතිරණ මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ඉන්දියාවේ, පටියාලා පන්ජාබ් විශ්වවිද්‍යාලයේ 2013.02.24 සිට 2013.02.28 දින දක්වා පැවති හයවැනි දකුණු ආසියානු විශ්වවිද්‍යාල සංස්කෘතික උළෙලට සහභාගී වූ, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය නියෝජනය කළ කණ්ඩායම දක්ෂතම සහ ප්‍රථම ස්ථානය දිනාගත් කණ්ඩායම ලෙස පත්වූ බවට මෙරට පුවත්පත්වල පළවී තිබූ බවත්;

(ii) එසේ වුවද, එම උළෙලේදී සංස්කෘතික අංග ඉදිරිපත් කිරීම විනා තරග පැවැත්වීමක් සිදු නොකළ බවත්;

(iii) ඉහත උළෙලේදී සහභාගීත්වය සඳහා සහතිකපත්‍රයක් පමණක් ලබාගත් ඉහත කණ්ඩායම ප්‍රථම ස්ථානය ලබාගත් කණ්ඩායම ලෙස හුවා දක්වමින් ඔබතුමා ද ඇතුළු විද්වත් පිරිසක්, කැඳවා විශාල මුදලක් වැයකර ව්‍යාජ ඇගයීමේ උළෙලක් පවත්වන ලද බවත්;

(iv) එම වංචනික ක්‍රියාව සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ උප කුලපති ජයසේන කෝට්ටගොඩගේ මහතා විසින් තම පුත් ජානක කෝට්ටගොඩගේ මහතා වෙනුවෙන් සිදුකළ බවට එම විශ්වවිද්‍යාලයේ දෘශ්‍යකලා පීඨ ශිෂ්‍ය සංගමයේ ලේකම් විසින් චෝදනා කරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත වංචනික ක්‍රියාව සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පවත්වා වැරදිකරුවන්ට දඬුවම්දීමට කටයුතු කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4419/'13

ගරු රෝසි සේනානායක මහත්මිය,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ වලව විශේෂ බලප්‍රදේශයට යටත්ව පවතින, ඇඹිලිපිටිය කඩදාසි කම්හලට අයත් අක්කර 500ක පමණ භූමි ප්‍රදේශයේ පවතින;

(i) නිල නිවාස හා අනෙකුත් ගොඩනැගිලි ආදිය මේ වන විට පරිහරණය කරනු ලබන්නේද;

(ii) ඉඩම්වල අනවසරයෙන් පදිංචිවීම් සම්බන්ධව තොරතුරු ලැබී තිබේද;

(iii) ඉඩම්වල ගස් සහ දැව කොටස් කපා ප්‍රවාහනය කිරීම පිළිබඳ තොරතුරු ලැබී තිබේද;

(iv) ඉඩම්, ගොඩනැගිලි සහ අනෙකුත් දේපළ ආරක්ෂා කිරීම වෙනුවෙන් යම්කිසි වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4627/'13

ගරු සුජීව සේනසිංහ මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2013 වර්ෂයේ අයවැය ලේඛනයට අනුව එම වර්ෂය තුළ ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය මගින් ඉදිකිරීමට යෝජිතව තිබූ නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම අයවැය යෝජනා පරිදි සාදා නිම කළ අලුත් නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) එම නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇති ප්‍රදේශ කවරේද;

(iv) එම නිවාස ව්‍යාපෘතිවලින් රජයේ සේවකයින්ට ලබා දුන් නිවාස සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4636/'13

ගරු පී. හැරිසන් මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2014 අයවැයෙන් ගොවි විශ්‍රාම වැටුප ලබා දීමේ කාලය අවුරුදු 63 දක්වා දීර්ඝ කිරීමට හේතු වූ කරුණු කවරේද;

(ii) 1987 අංක 12 දරන ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රම පනතින් වයස අවුරුදු 60 දී ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම සම්මත වුවද, එය අවුරුදු 63 දක්වා දීර්ඝ කිරීම හේතුවෙන් එකී පනත උල්ලංඝනය වීමක් සිදුවන්නේද;

(iii) නොඑසේ නම්, 2011 වර්ෂයේ සිට 2013 නොවැම්බර් මාසය දක්වා වාරික ගෙවා විශ්‍රාම වැටුපට සුදුසුකම් ලැබූ අය වෙනුවෙන් හිඟ විශ්‍රාම වැටුප් ගෙවීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ගොවි විශ්‍රාම වැටුපේ දායකත්වය වයස අවුරුදු 18 සිට වෙන් වෙන් වශයෙන්;

(ii) ගොවි විශ්‍රාම වැටුප සඳහා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ, ගොවිසෙත ලොතරැයියේ හා ගොවි ජනතාවගේ දායකත්වය වෙන් වෙන් වශයෙන්;

එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4847/'14

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) ශ්‍රී ලංකාවේ සූදු ව්‍යාපාරය කරගෙන යාම සඳහා මේ දක්වා නිකුත් කර ඇති බලපත්‍ර ප්‍රමාණය කොපමණද;

(ii) එවන් බලපත්‍ර ලබාගෙන ඇති පුද්ගලයන්ගේ සහ / හෝ සමාගම්වල නම් කවරේද;

(iii) එම එක් එක් බලපත්‍රය නිකුත් කරන ලද දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

4944/'14

ගරු තිස්ස අත්තනායක මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සම සෞඛ්‍ය හෙවත් හෙද සහ පරිපූරක වෛද්‍ය සේවා උපාධි පාඨමාලාව සඳහා නියමිත වූ කාල සීමාව කවරේද;

(ii) මේ වන විට එම උපාධි පාඨමාලාව හදාරනු ලබන මුළු සිසුන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම උපාධි පාඨමාලාව සඳහා වාර්ෂිකව ඇතුළත් කර ගනු ලබන සිසුන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) සිව් අවුරුදු උපාධි පාඨමාලාවක් ලෙස සැලසුම් ඉදිරිපත් කොට විෂය නිර්දේශ සකස් කළ ඉහත සඳහන් උපාධි පාඨමාලාවේ කාල සීමාව මේ වන විට වසර තුනක් දක්වා අඩු කර තිබේද;

(ii) එසේ නම්, සිව් අවුරුදු පාඨමාලාවක් ලෙස විෂය නිර්දේශ සකස් කළ එම උපාධි පාඨමාලාව වසර තුනකින් නිම කිරීමට හැකියාවක් තිබේද;

(iii) එම උපාධි පාඨමාලාවේ අධ්‍යයන කාල සීමාව අඩු කිරීම හේතුවෙන් එම සිසුන්ට අසාධාරණයක් සිදු වන්නේද;

(iv) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2014 නොවැම්බර් මස 13 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2755/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2012 මැයි මාසයේ සිට නුවරඑළිය දිස්ත්‍රික්කයේ පාසල් දරු දැරියන් සඳහා දිනපතාම කිරි වීදුරුවක් ලබාදීමේ වැඩසටහනක් ආරම්භ කරනු ලැබුවේද;

(ii) එසේ නම්, එම වැඩසටහන යටතේ කිරි වීදුරුවක් ලබා දෙන පාසල් ළමුන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී එක් කිරි ලීටරයක් වෙනුවෙන් වැය කළ මුදල කොපමණද;

(ii) එම වැඩසටහන සඳහා එක් මාසයක් වෙනුවෙන් වැය කළ මුදල කොපමණද;

(iii) පාසල් ළමුන්ට කිරි වීදුරුවක් ලබාදීමේ වැඩසටහන මේ වන විටත් නුවරඑළිය දිස්ත්‍රික්කය තුළ සාර්ථකව ක්‍රියාත්මක වන්නේද;

(iv) මෙම වැඩසටහන මගින් දිවයින පුරා සියලුම පාසල්වල දරු දැරියන්ට දෛනිකව කිරි වීදුරුවක් ලබා දීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3246/'12

ගරු රවී කරුණානායක මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට අදාළව,

(i) 2012 වර්ෂයේ සිට අද දක්වා ලැබූ ලාභය හෝ අලාභය කොපමණද;

(ii) 2015 - 2016 වර්ෂ සඳහා අපේක්ෂිත ලාභය හෝ අලාභය කොපමණද;

(iii) අද වන විට තිබෙන ප්‍රාග්ධන ප්‍රමාණය සහ සංචිත ප්‍රමාණය කොපමණද;

(iv) එම ආයතනයේ සේවය කරන පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(v) එහි සේවක අතිරික්තයක් හෝ සේවක හිඟයක් තිබේද;

(vi) එම ආයතනය සේවකයෙකු වෙනුවෙන් දරන වියදම සහ සේවකයෙකුගෙන් ලබන ලාභය කොපමණද;

(vii) කෙටි කාලීන ණය, බැංකු අයිරා, මධ්‍ය කාලීන සහ දිගු කාලීන ණය යනාදියෙහි මේ වන විට පවතින මුළු එකතුව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3713/'13

ගරු අනුර දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) 2010, 2011 සහ 2012 වර්ෂවලදී ජනාධිපති අරමුදලට ලැබුණු මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) එම මුදල් සම්පාදනය කරගත් ආකාරය කවරේද;

යන්න වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ජනාධිපති අරමුදලින් පසුගිය වර්ෂ දෙක තුළ දී වැය කරනු ලැබූ සමස්ත මුදල;

(ii) එක් එක් ක්ෂේත්‍රය අනුව වැය කළ මුදල;

කොපමණද යන්නත් වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ජනාධිපති අරමුදලින් වෛද්‍ය ප්‍රතිකාර සඳහා ආධාර ලබා දීම සඳහා පුද්ගලයින් තෝරා ගැනීම සිදුකරන පදනම කවරේද;

(ii) පසුගිය වර්ෂ 03ක කාලය තුළ ප්‍රාදේශීය සභා, පළාත් සභා සහ පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරුන් වෙනුවෙන් වෛද්‍ය ප්‍රතිකාර සඳහා ජනාධිපති අරමුදලින් ආධාර ලබා දී තිබේද;

(iii) එසේ නම්, ඔවුන්ගේ නම් සහ එක් එක් තැනැත්තාට ලබා දුන් මුදල් ප්‍රමාණය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3925/'13

ගරු සුජීව සේනසිංහ මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) විදේශ රැකියා ඒජන්සි ආයතන විශාල සංඛ්‍යාවක් මගින් වැඩි වැටුප් ලැබෙන නිශ්චිත රැකියා සඳහා යොමු කරන බව පවසමින් විදේශගත කරනු ලබන ශ්‍රමිකයින් විදේශයන්හිදී අඩු වැටුප් ලබන රැකියාවල යොදවනු ලබන බව එතුමා දන්නෙහිද?

(ආ) ව්‍යාජ තොරතුරු සපයා ශ්‍රමිකයින් විදේශගත කරන රැකියා ඒජන්සිකරුවන්ට එරෙහිව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් ගෙන ඇති නීතිමය පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4397/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අධ්‍යාපන විද්‍යා පීඨවල පුහුණුව ලබන අභ්‍යාසලාභියෙකු සඳහා මාසිකව ගෙවනු ලබන මුදල කොපමණද;

(ii) එම මුදල ගෙවීම ආරම්භ කළ දිනය කවරේද;

(iii) එම මුදල ගෙවීම ආරම්භ කිරීමට පෙර ගෙවන ලද මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) සීමාවාසික කාලය තුළදී අධ්‍යාපන විද්‍යා පීඨ ගුරු අභ්‍යාසලාභියෙකුට වැටුප් හෝ දීමනා ලෙස ගෙවනු ලබන මුදල කොපමණද;

(ii) එම මුදල ගෙවීමට පෙර ගෙවන ලද මුදල කොපමණද;

(iii) වර්තමාන ජීවන වියදම හා සැසඳීමේදී දැනට ගෙවනු ලබන මුදල ප්‍රමාණවත් නොවන බව පිළිගන්නේද;

(iv) එසේ නම්, දැනට ඔවුන්ට ගෙවනු ලබන දීමනා හෝ වැටුප වැඩි කිරීමට කටයුතු කරන්නේද;

(v) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4680/'13

ගරු පී. හැරිසන් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උතුරු මැද පළාතේ වකුගඩු රෝගය සම්බන්ධයෙන් වාර්තාවක් ලබා දෙන ලෙස ලෝක සෞඛ්‍ය සංවිධානය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබුවේද;

(ii) එම වාර්තාව සැකසීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් වැය කළ මුදල කොපමණද;

(iii) එම වාර්තාව සකස් කිරීමට ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් වැය කළ මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වකුගඩු රෝගය සම්බන්ධයෙන් ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් ලබා දුන් වාර්තා සංඛ්‍යාව කොපමණද;

(ii) එම වාර්තා සෞඛ්‍ය අමාත්‍යාංශයට ලැබුණු දින වකවානු කවරේද;

(iii) ලෝක සෞඛ්‍ය සංවිධානයේ එම වාර්තා සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් පිළිගනු ලබන්නේද;

(iv) එම වාර්තාවල අඩංගු කරුණු අනුව දැනට වකුගඩු රෝගය පාලනය කිරීමට ගෙන ඇති පියවර කවරේද;

(v) මුල් වාර්තාවල සඳහන් නිර්දේශ ක්‍රියාත්මක නොකිරීමට හේතු කවරේද;

(vi) ඒ සඳහා කවර හෝ පාර්ශ්වයක බලපෑමක් ඇතිවූයේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4770/'14

ගරු අශෝක් අබේසිංහ මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය මගින් පාසල් බස්රථ පමණක් ධාවනය කරවනු ලබන මාර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) දැනට පාසල් බස්රථ ධාවනයේ යොදවා නොමැති මාර්ග සංඛ්‍යාව කොපමණද;

(iii) එම මාර්ගවල පාසල් බස්රථ ධාවනය කරවීම සඳහා කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4959/'14

ගරු නිරෝෂන් පෙරේරා මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ, වෙන්නප්පුව බස් ඩිපෝව සඳහා අනුයුක්ත කර ඇති බස් රථ සංඛ්‍යාව;

(ii) මේ වන විට එම ඩිපෝව මගින් දෛනිකව ධාවනය කරවන බස් රථ සංඛ්‍යාව;

(iii) දැනට එම ඩිපෝවෙන් ධාවනයෙන් ඉවත් කර ඇති බස් රථ සංඛ්‍යාව;

(iv) එකී බස් ඩිපෝවේ සේවයේ නියුතු මුළු සේවක සංඛ්‍යාව;

(v) ඔවුන්ගේ මාසික වැටුප් හා දීමනා ගෙවීම සඳහා අවශ්‍ය මුදල;

(vi) එම බස් ඩිපෝවේ මාසික ලාභය හෝ අලාභය;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2014 නොවැම්බර් මස 14 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2678/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) විශ්‍රාම වැටුප් ගෙවීමේදී කිසියම් මාසයක 01 වැනි දිනෙක විශ්‍රාම ගිය අයෙකුට අදාළ මාසයේ විශ්‍රාමිකව සිටි දින ගණනට හෙවත් මුළු මාසයම සඳහා අඩු නොකළ විශ්‍රාම වැටුප ගෙවන අතර, 02 වැනි දිනක විශ්‍රාම ගිය අයට හුදෙක් ඊළඟ මාසයේ සිට පමණක් අඩු නොකළ විශ්‍රාම වැටුප ගෙවන බවත්;

(ii) මාසයේ මුල් දිනය නොවන දිනක විශ්‍රාම යන අයට එම තත්ත්වය බලවත් අසාධාරණයක් බවත්;

(iii) විශ්‍රාම වැටුප් ගණනය සිදු කළ යුත්තේ එවැනි අසාධාරණ ක්‍රමයකට බව විශ්‍රාම වැටුප් සංග්‍රහයේ කිසිදු වගන්තියක සඳහන් නොවන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) එසේ නම්, විශ්‍රාම වැටුප් සංග්‍රහයේ 31 වැනි වගන්තියෙන් පැවැරී ඇති බලය පාවිච්චි කර හෝ සුදුසු වෙනත් ආකාරයකට අතීතයටත් බලපැවැත්වෙන සේ උක්ත අසාධාරණය ඉවත් කොට ඒ අනුව විශ්‍රාමිකයින්ට හිමිවිය යුතු හිඟ මුදල් ගෙවීමට කටයුතු කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3317/'12

ගරු රවී කරුණානායක මහතා, — ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2011.05.31 වැනි දින සිට මේ දක්වා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පනතේ 16 වැනි සහ 17 වැනි වගන්ති යටතේ ආයෝජන ප්‍රවර්ධන මණ්ඩලය සමග ගිවිසුම්වලට එළඹ ඇති සමාගම් සංඛ්‍යාව සහ ඒ සඳහා ඉල්ලීම් කර ඇති රාජ්‍ය ව්‍යාපාර සංඛ්‍යාව වාර්ෂික සහ එක් එක් වගන්තිය පදනමින් කවරේද;

(ii) ඉහත (i)හි සඳහන් ව්‍යාපාර අතරින් මේ වන විට වාණිජ මෙහෙයුම් ආරම්භකර ඇති ව්‍යාපාර සංඛ්‍යාව කොපමණද;

(iii) ඉහත (i)හි සඳහන් පරිදි සිදු කර ඇති ආයෝජනවල වටිනාකම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් සමාගම්වලට ලබාදී ඇති බදු විරාම කවරේද;

(ii) 2010.01.01 දින සිට 2012.12.31 දින දක්වා කාල පරිච්ඡේදය තුළ ලියාපදිංචි වී ඇති සහ මෙහෙයුම් ආරම්භ කර ඇති සමාගම් සංඛ්‍යාව වාර්ෂික පදනමින් සහ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පනතේ වගන්ති පදනමින් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3922/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) මහනුවර නගරය තුළ එක්රැස්වන කැළිකසළ මහනුවර, ගොහාගොඩ ප්‍රදේශයේ මහවැලි ගඟ ආසන්නයේ වූ ස්ථානයකට බැහැර කරන බවත්;

(ii) එම ස්ථානය අසල සත්ව ගොවිපළක් පවත්වාගෙන යනු ලබන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ස්ථානයේ සත්ව ගොවිපළක් පවත්වාගෙනයෑම සඳහා නීත්‍යානුකූල අවසරයක් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එම අවසරය ලබා දී ඇති ආයතනයේ හෝ ආයතනවල නම් කවරේද;

(iii) එම සත්ව ගොවිපළෙහි හිමිකරුගේ නම සහ ලිපිනය කවරේද;

(iv) එකී සත්ව ගොවිපළේ හිමිකරු එම ව්‍යාපාරයට අමතරව වෙනත් ආයතනයක රැකියාවක් කරනු ලබන්නේ නම්, එම ආයතනයේ නම සහ ඔහු විසින් දරනු ලබන තනතුර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4506/'13

ගරු සුජීව සේනසිංහ මහතා,— සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) සීමාසහිත ශ්‍රී ලංකන් ගුවන් සමාගම සඳහා අලුතෙන් ගුවන් යානා දහයක් මිලදී ගැනීමේ සැලසුමක් ඇති බව දන්නේද;

(ii) මිලදී ගැනීමට අපේක්ෂිත එම ගුවන් යානා සඳහා වැය කිරීමට නියමිත මුදල කොපමණද;

(iii) එම ගුවන් යානා මිලදී ගන්නේ කුමන රටකින්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සීමාසහිත ශ්‍රී ලංකන් ගුවන් සමාගම සහ සීමාසහිත මිහින් ලංකා (පෞද්ගලික) ගුවන් සමාගම 2013 ජනවාරි සිට මේ දක්වා ලැබූ පාඩුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) අධික පාඩු ලබමින් පවත්වාගෙන යනු ලබන ශ්‍රී ලංකන් ගුවන් සමාගම සඳහා අලුතෙන් ගුවන් යානා මිලදී ගැනීමට ප්‍රතිපාදන සපයා ගනු ලබන ආකාරය කවරේද;

(iii) එම නව ගුවන් යානා මිලදී ගැනීම අනුමත කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4758/'14

ගරු අශෝක් අබේසිංහ මහතා,— දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) හෝමියෝපති වෛද්‍ය සභාව පිහිටුවූ දිනය කවරේද;

(ii) මේ වන විට හෝමියෝපති වෛද්‍ය සභාව ක්‍රියාත්මක වන්නේද;

(iii) 2012 වර්ෂය වන විට දිවයිනේ ලියාපදිංචි වී සිටි හෝමියෝපති වෛද්‍යවරු සංඛ්‍යාව කොපමණද;

(iv) හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ප්‍රචලිත කිරීම සඳහා අමාත්‍යාංශයෙන් යම් කිසි වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5031/'14

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— උද්භිද උද්‍යාන හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව තුළ සේවය කරනු ලබන පශු වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වන විට එම දෙපාර්තමේන්තුව තුළ පශු වෛද්‍යවරුන් සඳහා පුරප්පාඩු පවතින්නේද;

(iii) එසේ නම්, එම පුරප්පාඩු කඩිනමින් පිරවීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දෙහිවල සත්වෝද්‍යානයේ රඳවා සිටින අලි ඇතුන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සතුන් අතරින් මේ වන විට ක්ෂය රෝගය වැළඳී ඇති සංඛ්‍යාව කොපමණද;

(iii) එම රෝගී සතුන්ට ප්‍රතිකාර කිරීම සඳහා ප්‍රමාණවත් පහසුකම් දෙහිවල සත්වෝද්‍යානය තුළ තිබේද;

(iv) ක්ෂය රෝගය වැළඳී ඇති අලි ඇතුන් මගින් සත්වෝද්‍යානයේ සිටින අනෙකුත් සතුන් අතර එම රෝගය පැතිර යෑම වැළැක්වීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) පින්නවල අලි අනාථාගාරයේ සිටින අලි ඇතුන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම අලි ඇතුන් අතර ක්ෂය රෝගය වැළඳුන සතුන් සිටින බව වාර්තා වී තිබේද;

(iii) පින්නවල අලි ඇතුන් ක්ෂය රෝගයෙන් ආරක්ෂා කිරීමට ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

5171/'14

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ පළමුවැනි, දෙවැනි සහ තුන්වැනි වසර විභාගවලදී සිංහල සහ දෙමළ භාෂාවන්ගෙන් පිළිතුරු සපයනු ලබන සිසුන්ට ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් ප්‍රශ්න පත්‍ර ලබා දීමට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම තීරණයට හේතුව කවරේද;

(iii) එම තීරණයට අධිකරණ අමාත්‍යවරයාගේ එකඟතාව ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5184/'14

ගරු තලතා අතුකෝරල මහත්මිය,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කුඩා තේ ඉඩම්වල පාංශු හා ජල සංරක්ෂණයට රජයේ සහනාධාර ලබාදීමේ වැඩපිළිවෙළක් 2014 අයවැය යෝජනාවලට ඇතුළත් කර තිබේද;

(ii) එසේ නම්, තේ අක්කරයකට ලබා දෙන මුදල කොපමණද;

(iii) මේ වන විට එම වැඩ සටහන ක්‍රියාත්මක වන දිස්ත්‍රික්ක කවරේද;

(iv) එම දිස්ත්‍රික්ක අතරින් ඉහත සහනාධාර මුදල සම්පූර්ණයෙන් ලබා දී ඇති හා කොටස් වශයෙන් ලබා දී ඇති දිස්ත්‍රික්ක වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) එම සහනාධාරය ලබා දෙන කුඩා තේ වතු හිමියන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) දිස්ත්‍රික්ක 08 ක කුඩා තේ වතු හිමියන් සඳහා එම සහනාධාර මුදල ලබා දිය යුතු නමුත්, පසුගිය කාලයේ පළාත් සභා මැතිවරණ පැවති දිස්ත්‍රික්ක සඳහා පමණක් ඊට අදාළ අත්තිකාරම් මුදල් ලබා දෙන ලෙස දන්වා ඇති අතර සෙසු දිස්ත්‍රික්ක තුළ එම වැඩපිළිවෙළ ක්‍රියාත්මක නොකිරීමට හේතු කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2014 නොවැම්බර් මස 15 වැනි සෙනසුරාදා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2756/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) "පුරවර පුබුදුව" වැඩසටහන වෙනුවෙන් 2012 වර්ෂයට වෙන් කළ මුළු මුදල කොපමණද;

(ii) එම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී අනුගමනය කරන ලද ප්‍රධාන නිර්ණායකයන් කවරේද;

(iii) පුරවර පුබුදුව වැඩසටහන සඳහා මේ වන විට තෝරා ගෙන ඇති ප්‍රදේශ කවරේද;

(iv) එම වැඩසටහන තුළින් ආවරණය කිරීමට අපේක්ෂිත ප්‍රදේශ සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3555/'13

ගරු රවී කරුණානායක මහතා,— පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය වර්ෂ 3 තුළ දේශීයව සහ විදේශ රටවලින් මිලට ගන්නා ලද එළදෙනුන් සංඛ්‍යාව වාර්ෂික පදනමින් කොපමණද;

(ii) විදේශීය රටවලින් මිලට ගත් එක් එළදෙනකගේ මිල කොපමණද;

(iii) එම එළදෙනකගේ සාමාන්‍ය මිල කොපමණද;

(iv) මිලට ගත් මුල් ස්ථානයේ සිට ගමනාන්ත ගොවිපොළ දක්වා රැගෙන එන ලද එක් එළදෙනකු වෙනුවෙන් දරන මුළු පිරිවැය කොපමණද;

(v) ඔවුන් ආනයනය කළේ කිනම් රටකින්ද;

(vi) එළදෙනුන් මිලදී ගැනීම සඳහා එම රට තෝරා ගැනීමට හේතුව කවරේද;

(vii) ඉහත සඳහන් මිලදී ගැනීම නිසි ටෙන්ඩර් පටිපාටියක් අනුව සිදු කරන ලද්දේද;

(viii) නොඑසේ නම්, එම මිලදී ගැනීම් සිදු කරන ලද පදනම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4398/’13

ගරු බුද්ධික පතිරණ මහතා,— පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පොල් පර්යේෂණ ආයතනයේ සේවය කරනු ලබන ශිල්පීය නිලධාරීන්ට හිමිවිය යුතු වැටුප් වර්ධක පහක් එම ආයතනයේ පරිපාලනය විසින් අහිමි කර ඇති බවත්;

(ii) ඒ සම්බන්ධයෙන් එම නිලධාරීන් විසින් කම්කරු කොමසාරිස්වරයාට පැමිණිලි කිරීමෙන් පසු එම වැටුප් වර්ධක ගෙවන ලෙස නියම කර ඇති බවත්;

(iii) පොල් පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂවරයා විසින් එම වැටුප් වර්ධක පහ ගෙවීම තවදුරටත් පැහැර හරින බවට එම සේවක පිරිස විසින් චෝදනා කරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ශිල්පීය නිලධාරීන්ට හිමි විය යුතු වැටුප් වර්ධක ලබාදීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4948/’14

ගරු සුජීව සේනසිංහ මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ පාඩුව මේ වන විට රුපියල් බිලියන 95 ඉක්මවා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ලංකා බැංකුවේ සහ මහජන බැංකුවේ බැංකු අයිරා වෙනුවෙන් පමණක් රුපියල් කෝටි 43කට අධික මුදලක් ගෙවීමට තිබේද;

(ii) මේ වන විට රාජ්‍ය බැංකු විසින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ණය ලබා දීම ප්‍රතික්ෂේප කර තිබේද;

(iii) එසේ නම්, එම තත්ත්වය යටතේ ඉහළ ණය පොලී කොන්දේසි මත විදේශීය තෙල් සමාගම්වලින් ඉන්ධන ලබා ගැනීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5102/'14

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමලයේ පිහිටි තෙල් ගබඩා ටැංකි සංකීර්ණයට අයත් සමස්ත ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් ප්‍රමාණයට අදාළව මැනුම් සැලැස්මක් තිබේද;

(iii) නොඑසේ නම්, එකී ඉඩම් ප්‍රමාණයට අදාළව මැනුම් කටයුතු සිදු කර එවැනි සැලැස්මක් සැකසීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ත්‍රිකුණාමලය තෙල් ගබඩා ටැංකි සංකීර්ණයට අයත් තෙල් ටැංකි සංඛ්‍යාව කොපමණද;

(ii) ඉහත (i)හි සඳහන් තෙල් ටැංකිවලින් මේ වන විට භාවිතා කරනු ලබන ටැංකි සංඛ්‍යාව කොපමණද;

(iii) එම තෙල් ටැංකි අතරින් ලංකා අයි.ඕ.සී. සමාගමට ලබා දී ඇති සංඛ්‍යාව කොපමණද;

(iv) එකී සමාගමට තෙල් ගබඩා ටැංකි ලබා දුන් ගිවිසුම්ගත කාල සීමාව මේ වන විට අවසන් වී තිබේද;

(v) එසේ නම්, එම ගිවිසුම් යාවත්කාලීන කර එම සමාගමෙන් අය විය යුතු මුදල් අය කර ගැනීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5178/'14

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ඇටෝර්නි බලපත්‍ර හා සම්බන්ධව දැනට රටේ පවතින නීතිය යල් පැන ගිය නීතියක් බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ඇටෝර්නි බලපත්‍ර හා සම්බන්ධ නීතිය වෙනස් කිරීමට අදාළ කරුණු විමර්ශනය කිරීම සඳහා කමිටුවක් පත් කර තිබේද;

(ii) එම කමිටුවේ පළමුවැනි රැස්වීම පවත්වනු ලැබූ දිනය කවරේද;

(iii) එම කමිටුවේ කටයුතු අඩාලවීමට හේතුව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඇටෝර්නි බලපත්‍ර හා සම්බන්ධ නීතිය සංශෝධනය කිරීම පිණිස කඩිනම් ක්‍රියාමාර්ගයක් ගැනීමේ අවශ්‍යතාවය පැන නැඟී තිබේද;

(ii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගන්නා ක්‍රියාමාර්ගය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

5197/'14

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) දැනට මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ ඇති මුදල් ශේෂය කොපමණද;

(ii) එම අරමුදලේ මුදල්, කොටස් වෙළඳපොළේ ආයෝජනය කර තිබේද;

(iii) එසේ නම්, එම අරමුදලින් කොටස් මිලදී ගෙන ඇති ආයතන කවරේද;

(iv) එම එක් එක් ආයතනයෙන් මිලදී ගෙන ඇති කොටස් සංඛ්‍යාව කොපමණද;

(v) 2013 වර්ෂය අවසානයේදී එම එක් එක් ආයෝජනයේ ප්‍රගතිය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම අරමුදලේ මුදල් භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර මිලදී ගැනීමට යොදවා තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා තැරැව්කරුවන්ගේ සහාය ලබා ගෙන තිබේද;

(iii) එම තැරැව්කරුවන් කවුරුන්ද;

(iv) ඔවුන්ට කරන ලද ගෙවීම්වල වටිනාකම කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5262/'14

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කිලිනොච්චිය, අක්කරයාන්, ස්කන්ධපුරම් සහ ආනෙයිවිලුන්දාන් යන ප්‍රදේශවල ජනතාව තම ගමනාගමන පහසුකම් සලසා ගැනීමේදී බොහෝ දුෂ්කරතාවලට මුහුණ දෙන බවත්;

(ii) ඔවුන්ට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ හෝ පෞද්ගලික අංශයේ බස් රථ බලාපොරොත්තුවෙන් පැය ගණන් මාර්ගයේ බලා සිටීමට සිදුවී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, ඉහත සඳහන් ප්‍රදේශවල ජනතාවගේ ප්‍රවාහන ගැටලු විසඳීම සඳහා පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේනම්, ඒ මන්ද?